## ජගත් ජේ එදිරිසිංහ ලියන අලුත්ම නවකතාව

### පළමුවන කොටස

බෝම්බය පිපිරුණේ හරියටම උදෑසන දහයට දහයක් තිබිය දී ය. කඩි ගුලක් සේ ඇවිස්සුණ වත්තේ කොළු නඩය ගැහැණු හා පිරිමි එක පිම්මේ පාර දෙසට දුව යනු ජනේලය තුළින් තිසල්ට පෙනෙයි.

''තවත් එකක් නේද?'' ලොකු හාමුදුරුවන්ගේ හඬ ලැගුම් ගෙය දෙසින් ඇසෙයි.

''වැඩි දුරක නෙවෙයි වගේ'' පොඩි හාමුදුරුවන් පිළිතුරු දෙන්නේ ආලින්දයේ සිට තිසල් පාඩම් කරමින් සිටින කාමරයට එන අතර ය. ''ඉක්මණට ගෙදර යන්ඩ එපා.. කලබලේ ටිකක් අඩු වුණාම හවස් වෙලා යන්ඩ..'' උන්වහන්සේ ගෙන ආ තේ කෝප්පය තිසල් ඉදිරියේ මේසය මත තැබූ හ.

දාහතේ වත්තට මහ දුරක් නැත. පාරෙන් පැන වත්තට යන්නට වැඩිම වුණොත් විනාඩි දහයකි.

''මේක මහා අවාසනාවන්ත කාලයක්..'' පොඩි හාමුදුරුවෝ ජනේලය තුළින් පාර දෙස බලාගත්වන ම මුමුණති.

සැඩ හිරු රැස් පන්සලේ තැඹිලි අතු අතරින් රිංගා මිදුල මත පතිතව ඇත. පාර දෙදරවමින් වියරුවෙන් මෙන් ඇදෙන රිය හඬ අතරේ බෝධිය දෙසින් බිම අමදින හඬක් ඇසෙයි. සෙදෝරිස් විය යුතු ය. තමන්ගේ ම ලෝකයක අතරමංව සිටින ඔහුට ලෝකය පෙරළුණ ද වගේ වගක් නැත.

''පාඩම් කරන්ඩ... කල්පනා කරන්ඩ එපා.. පාඩම් කරන්ඩ.. මේව වළක්වන්ඩ අපට කරන්නඩ දෙයක් නෑ.. දෙයක් කරන්නඩ පුලුවන් ඇත්තො ලංකාවෙම මිනිස්සුන්ගෙ නාහ විදලා අයාලේ ඇදගෙන යද්දි අපි මක් කරන්න ද..?'' පොඩි හාමුදුරුවන් අවසන් වාක්‍යය කීවේ කාමරයෙන් පිටව යන අතරේ දී ය. තමන්ටම කියා ගන්නා සේ ය. එනිසාම අවසන් වචන කීපය තිසල්ට පැහැදිළිව ඇසුණේ ද නැත.

පන්සලේ තාප්පය කැඩුණ තැනින් පැනගත් චූටියා හතිලමින් පැමිණ ජනේලයේ එල්ලෙයි. ඔහුගේ කන් දෙක දෙපැත්තෙන් දාඩිය බේරෙනු තිසල්ට පෙනෙයි.

''දාතුනයි.. ''

''මොකක්...?''

''දාතුනයි... බොඩීස් දාතුනයි.. කාර් පහයි.. ඔක්කොම දාඅටයි'' චූටියා ජනේලය අතහැර නැවත දුවන්නට සැරසෙයි.

''ඒයි.. ඕම ඉන්නවා... කී දෙනෙකුට තුවාල ද..?'' තිසල් ජනෙල් කූරු අතරින් එබී අසයි. චූටියා කැඩුණ තාප්පය මත සිට හැරී බලයි.

''කව්ද දන්නෙ... මහා ගොඩයි.. කාර්වල පැටෙව්වා.. ඉස්පිරිතාලෙ යැව්වා.. විස්සක්.. තිහක්.. අනේ මන්දා.. සීයක් විතර ඇති..''

''ඉලක්කම් වලින් එහාට යමක් නෑ නේද තිසල්..?'' පොඩි හාමුදුරුවන් ගේ කටහඬ තිසල්ට ඇසෙයි. ''.. ඊයෙ කීය ද..? අද කීය ද..? උන්ගෙ කීය ද..? අපේ කීය ද..?''

පොඩි හාමුදුරුවන් කියන්නේ ඇත්තක් නොවේ දැයි තිසල්ට සිතෙයි. ඔහු පොත වසා දමා කාමරයෙන් පිටතට එයි.

''පාඩං කොරලා අහවරයි..?'' සෙදෝරිස් කොස්සත් අතැතිව ආලින්දයට යන අතර අසයි. ''කම්මැලි නං බෝධිය පැත්තේ රවුමක් දාලා එන්ඩ.. මං බත් බෙදලා තියන්නං.. අද දවල් දානෙ ෆාරුක් මුදලාලිලාගේ ගෙදරිං.. පංකාදු පහයි..''

මැද සාලයේ හාන්සි පුටුවේ ලොකු හාමුදුරුවෝ පුවත්පතින් අඩක් වැසුණු මුහුණින් යුතුව නින්දක ය. තිසල් එතැන පසුකර මිදුලට බැස්සේ උන්වහන්සේගේ නින්දට බාධා නොවන සේ ඉතා සීරුවෙන් අඩි තබමින් ය. අලුත අමදින ලද වැලි මිදුල හරහා බණ මඩුවට ඇවිද ගිය තිසල් එහි කෙටි තාප්පය මත වාඩි වෙයි. මෙතැනට මහපාර අපූරුවට පෙනෙයි. තවමත් වරින් වර ගිලන් රථ වල සයිරන් නලා හඬ ඈතින් ඇසෙයි.

පන්සල ඉදිරියෙන් වියරු වේගයෙන් යනෙන රථ වාහන ශබ්දය කන්දොස්කිරියාවකි. ඈතින් එන වාහනයක ශබ්දය පන්සල පසු කර යනවාත් සමගම වෙනස් වෙයි. එසේ වන්නේ ඩොප්ලර් ආවරණය නිසා බව තිසල්ට සිහිපත් වෙයි. භෞතික විද්‍යාවේ ධ්වනිය පාඩම් කොටස නැවත සිහිපත් කරගන්නට ඔහු උත්සාහ ගනියි.

# ඇඩීස්

***“දන්න අඳුනන කාටවත් කරදරයක් නෑ නේද..?”***

***“දන්න තරමින් නං නෑ.. ඒත් ඉතින් හරියටම හොයලා බැලුවොත් නං ඉතින් කවුරුත් කාගෙත් නෑයොනේ..”***

ජගත් ජේ එදිරිසිංහ ලියයි



***අයේෂා සිනාසෙයි. හිත ඇතුළෙන් වඩාත් තදින් සිනා යයි. උදේ සිට මේ මේසය ඉදිරියේ සිදුවූයේ විසඳුම් දීමට වඩා ඒ ප්‍රශ්න කර තබාගෙන ආ මිනිසුන්ගේ සිත් සැනසීම පමණක් නොවේද යන්න සිහිපත් වන විට සිත තුළ සිනාව දෙගුණ තෙගුණ වෙයි. හෙට අනිද්දා වන විට මේ මිනිසුන් මේ ප්‍රශ්නම ඔසවාගෙන නැවත මේ කාර්යාල දොරෙන් ඇතුල් වන බව තමා සේම මන්ත්‍රීතුමාද හොඳින් දන්නා බව අයේෂා දනියි. අවශ්‍ය වන්නේ කල් ගැනීම පමණකි. කාලය විසින් යම් විසඳුමක් සොයා ගනු ලබන තෙක් කල් අල්ලා ගෙන සිටීම පමණකි.***

සෙන්ටිග්‍රේට් අංශක විස්සේ වියළි වාතයේ දී ශබ්දයේ වේගය තත්පරයට මීටර තුන්සිය හතළිස් තුනකි. පැයට කිලෝමීටර එක්දහස් දෙසිය තිස් පහකි. අද බෝම්බයෙන් මියගිය ගණන දහ තුනකි. තුවාල ලැබූ අය අතරින් කීප දෙනකු හෝ ඒ ගණනට එකතු වනු නිසැක ය.

සුනන්ද ගේ මෝටර් සයිකලට මහ ගේට්ටුවෙන් ඇතුල් වෙයි. ආවාසය දෙසට යන්නට ආ සයිකලය තිසල් දැක බණ මඩුව දෙසට හැරවෙයි.

''වත්තෙ පිස්සෙක් දෙන්නෙක් ජාත්‍යාලයක් දාන්ඩ ලෑස්ති වුණා.. ඒක සෙට්ල් කරන්ඩ ගියා..'' සුනන්ද සයිකලෙයන් නොබැසම කියයි.

''කවුද..?''

''කුඩු සෝමයා.. මහතුවා... උං අවුස්සන්ඩත් කාණ්ඩෙ ඉන්නවනේ.. එළ හරක්..'' සුනන්ද හෙල්මටය ගලවමින් සයිකලෙයන් බසියි. ''.. ගැහුවා කන පැලෙන්ඩ දෙකක්... පොඩි හාමුදුරුවො හම්බවෙන්ඩ ආවෙ.. මල්ලි දැන්ම යන්නෙ නෑනෙ..?''

''නෑ.. ටිකක් හවස් වෙනකල් පාඩම් කරනවා..''

''ඒක හොඳයි.. '' සුනන්ද කියන්නේ ආවාස ගෙය දෙසට ඇවිද යන අතර ය. තිසල් තාප්පයෙන් බිමට පැන ඔහු හා එක පෙළට වැටෙයි.

''දන්න අඳුනන කාටවත් කරදරයක් නෑ නේද..?''

''දන්න තරමින් නං නෑ.. ඒත් ඉතින් හරියටම හොයලා බැලුවොත් නං ඉතින් කවුරුත් කාගෙත් නෑයොනේ..''

****

''මං කතා කරනකං කාන්ඩෙ ඇතුළට එවන්න එපා කුමාර..'' රණසිංහ රිසිවරය අතට ගන්නා අතර දොර අසළ සිටි ආරක්ෂක භටයාට කියයි. ''මට පොඩි ෆෝන් කෝල්ස් ටිකක් ගන්න තියෙනවා..''

එක දිගට පැයක් දෙකක් වාඩි වී සිටීම නිසා මහන්සියක් දැනෙයි. රණසිංහ පුටුවෙන් නැගිට දෑත් දෙපසට කරකවා ව්‍යායාමයක් ගනියි.

''සර්ට මහන්සි වගෙයි..'' අයේෂා බලා සිටින්නේ මඳ සිනාවක් මුවේ නගා ගෙන ය.

''මහන්සි නැද්ද..? අහගෙන හිටියෙ නැද්ද උදේ ඉඳන් කී දෙනෙකුගෙ දුක් ගැනවිලි වලට විසඳුම් දුන්නද කියලා..?''

අයේෂා සිනාසෙයි. හිත ඇතුළෙන් වඩාත් තදින් සිනා යයි. උදේ සිට මේ මේසය ඉදිරියේ සිදුවූයේ විසඳුම් දීමට වඩා ඒ ප්‍රශ්න කර තබාගෙන ආ මිනිසුන්ගේ සිත් සැනසීම පමණක් නොවේද යන්න සිහිපත් වන විට සිත තුළ සිනාව දෙගුණ තෙගුණ වෙයි. හෙට අනිද්දා වන විට මේ මිනිසුන් මේ ප්‍රශ්නම ඔසවාගෙන නැවත මේ කාර්යාල දොරෙන් ඇතුල් වන බව තමා සේම මන්ත්‍රීතුමාද හොඳින් දන්නා බව අයේෂා දනියි. අවශ්‍ය වන්නේ කල් ගැනීම පමණකි. කාලය විසින් යම් විසඳුමක් සොයා ගනු ලබන තෙක් කල් අල්ලා ගෙන සිටීම පමණකි.

''මේ රටේ ප්‍රශ්න විසඳන්න මන්ත්‍රී කෙනෙකුට කරන්ඩ පුලුවන් බම්බුවක් නෑ ඕයි..'' මත් පැන් වීදුරුවක් තොලගා ගත් විට රණසිංහ තමා-ගේ කනට කොඳුරණ ඒ වචන අයේෂාට සිහිපත් වෙයි.

''එහෙනං මොකටද මන්ත්‍රී කෙනෙක් වෙන්නෙ..?'' එවන් විටෙක ඇය අසයි.

''ඉස්සෙල්ලා මගේ ප්‍රශ්න විසඳ ගන්න..'' ඔහු කියයි.

''ඇයි ඉතිං ඕක මිනිස්සු ඉස්සරහ කියන්නැත්තෙ ..?''

ඔහ් කොක් හඬ දී සිනාසෙයි. ඒ සිනාවේ ගැබ්ව ඇති අවඥාව අයේෂාට පුරුදු ය. ඔහුට ඇති තරම් සිනාසෙන්නට ඉඩ හැර අයේෂා නිහඬ වෙයි.

''පොලීසියෙ ඕ අයි සී ට කෝල් එකක් ගන්න'' රණසිංහ නැවත සිය සැප පුටුවේ වාඩි වෙයි.

අයේෂාට පොලීසියේ දුරකතන අංකය කට පාඩම් ය. දවසකට තුන් හතර පාරක් ඒ අංකය ඔබන බැවිනි.

''ඕඅයිසී මහත්තයට දාන්න.. මන්ත්‍රීතුමාට කතා කරන්න ඕනෙ කියනවා..'' අයේෂා පුරුද්දට එසේ කීව ද පොලීසියේ දුරකතනය බාර පොලිස් කාන්තාව ඇගේ කටහඬ හොඳින් හඳුනයි.

''අයිෂෙ අනුර.. මොකද දැන් තත්වෙ..?'' රණසිංහ අසන්නේ බෝම්බ පිපුරුම ගැන බව අනුර දනියි.

''හොස්පිට්ල් එකට ගෙනිච්ච අයගෙන් එක්කනෙක් මැරුණා සර්..'' පන්ති සමාර්ථයක් සහිතව උපාධිය සමත් වූ තමාට සාමාන්‍ය පෙළ වත් සමත් නොවූ මේ මිනිසාට සර් යයි ආමන්ත්‍රණය කරන්නට සිදුවීමේ වේදනාව යටපත් කරගන්නට අනුර මහත් වෑයමක් දරයි. ''දාහතේ වත්ත පැත්තෙ කාණ්ඩයක් කලබල කරන්ඩත් ලෑස්ති වුණා.. මං ඒක සෙට්ල් කලා සර්.. දැං ප්‍රශ්නයක් නෑ''

රණසිංහ මහ හඬින් සිනාසෙයි.

''බම්බුව.. තමුසෙ ඒක සෙට්ල් කරන්ඩ කලින් මං මගේ කොල්ලන්ට කියලා ඒක අහවර කරලයි තිබුණෙ.. මගේ කොට්ටාසෙ පිස්සු කෙළින්ඩ කාටවත් ඉඩ දෙන්ඩ බෑ.. පිස්සු කෙළින්ඩ එන එක්කෙනෙකුගෙ දෙන්නෙකුගෙ කනට දෙක ගානෙ ගැස්සුවාම ඔක්කොම ඉවරයි.. තත්වෙ සන්සුන්.. ඔහේට ඕනෙම නං රාලහාමිලා දෙතුන් දෙනෙක් ඒ පැත්තට දාලා ක්‍රෙඩිට් එක දාගත්තට කමක් නෑ.. ඊළඟ ප්‍රොමෝෂන් එකටත් බරක් වැටෙනවානේ..'' රණසිංහගේ සිනා හඬ කනට යවුලකින් අනින්නා සේ ය. අනුර රිසිවරය කනෙන් ඈත් කර අල්ලාගෙන සිටියේ ඒ සිනාව අවසන් වන තෙක් ය.

****

24 වන පිටුවට